මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

අවුරුදු දහයක් එක දිගට සංගීත කණ්ඩායමක් පවත්වාගෙන යාම විශාල අභියෝගයක්. රොෂාන් ලින්තොටගේ ඒ අභියෝගයට සාර්ථකව මුහුණ දුන් තරුණ සංගීතඥයෙක්. ඔහුගේ ගමනේ මේ සුවිශේෂ සන්ධිස්ථානයේ දී ඒ ගැන කතා කරන්නට අපි පසුගියදා මේ නිහතමානී සංගීතඥයා හා එක්වුණා.

ශ්‍රීනාත්
මේ සංගීත කණ්ඩායම ආරම්භ කළේ කොහොමද?

රොෂාන් - මම ඉස්කෝලෙ යන කාලේ ඉඳන් සංගීතයට කැමැත්තෙ හිටියා. ඒ වගේම ලංකාවේ සංගීත කණ්ඩායම් කීපයක් සමගම බැඩ කළා. ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙත් ඒ ආසාව යටපත් වුණෙ නැහැ. නමුත් සංගීත කණ්ඩායම ආරම්භ කරන්න මූලික වුනේ අනපේක්ෂිත සිද්ධියක්. දවසක් මාත් ප්‍රසන්නත් මෙල්බන් ක්‍රවුන් කැසිනෝ එක අසළින් ගමන් කරන විට ශ්‍රී ලංකාවෙන් ආ තරුණයෙක් හමුවුණා. අහම්බෙන් ඔහු සමග කතාවට වැටුණා. ඔහු නමින් සුබාෂ්. කතා කරනකොට කිව්වා ඔහු සංගීතය ගැන යමක් දන්නා බව. අපි දෙන්නත් හිතමින් සිටි අදහසට මේ අදහස එකතු වෙලා එතනින් තමයි සංගීත කණ්ඩායමක් ආරම්භ කරන්න ඕනෙයි කියන අදහස ආවේ. 1998 අපි අපේ සංගීත කණ්ඩායම පටන් ගත්තා.

ශ්‍රීනාත්
කවුද මේ නම යෝජනා කළේ?
රොෂාන් - අපි පුහුණු වන කාලෙදිත් බෑන්ඩ් එකට නමක් තිබුණෙ නැහැ. අපි ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරලා තමයි මේ නම දැම්මෙ.
මුලින්ම සංගීත කණ්ඩායමේ හිටියා ප්‍රසන්න. සුබාෂ්. අසංග . රුක්ෂාන් සහ මම.

ශ්‍රීනාත්
තාමත් මේ අය ඉන්නවද?
රොෂාන් - මේ වෙනකොට නම් නැහැ. නමුත් මේ අය අයින් වුණේ අමනාප වෙලා ප්‍රශ්න ඇති වෙලා නෙවෙයි. බොහෝ සංගීත කණ්ඩායම් වල සාමාන්‍ය ස්වභාවය තමයි ටිකක් කල් යනකොට සමහර සාමාජිකයන් ඉවත්ව යාම. නමුත් මේ අය ඉවත් වුණේ ඔස්ට්‍රේලියාවේ ජීවත් වීමේ දී මුහුණ දෙන්නට සිදුවන සාමාන්‍ය ප්‍රශ්න නිසා. මේ අය තාමත් එදා වගේම අප සමග හිතවත්ව ඉන්නවා.

ශ්‍රීනාත්
බී ෂාප් සංගීත කන්ඩායම ගැන කතා කරනකොට මට මතක් වෙන අපූරු දෙයක් තියෙනවා. ඒ තමයි ඔබ ආරම්භ කළ මෙපුර ගී ප්‍රසංගය.
රොෂාන් - මෙපුර ගී ප්‍රසංගය ආරම්භ කරන්න මූලික හේතුව වුණේ අපේ සංගීත කණ්ඩායම කෙහේ හරි සන්දර්ශණයකට සහභාගිවනවිට අපූරුවට ගීත ගායනා කරන්න පුලුවන් අපේ අය අප සමග ගී ගයන්න එකතු වෙනවා. ඉල්ලීම් කරනවා. මෙහෙම කාලයක් යනකොට මේ රටේ සිට ගී ගයන දක්ෂයන් පිරිසක් හඳුනා ගන්නට අපට හැකි වුණා. මේ අය එකට එකතු කරන්න තමයි අපි මෙපුර ගී ප්‍රසංගය කළේ. එය සාර්ථක වීම අපේ අභිසංක ප්‍රයත්නයේ මල්ඵල ගැන්වීමක් ලෙස මා දකිනවා. අනික එකම වේදිකාවක අපේ අය වැඩි පිරිසක් එක් කළ ප්‍රසංගය මෙපුර ගී ප්‍රසංගයයි.

ශ්‍රීනාත්
98 සිට මේ වන තෙක් සංගීත කණ්ඩායෙමේ සිටි සාමාජිකයන් ගැන කතා කළොත්..
රොෂාන් - අජිත් සේනසිංහ. මනෝ අබේසිංහ. ප්‍රසන්න සෙනරත්. සුනන්ද කුරේ. තරංග ෆොන්සේකා. සුජිත් ප්‍රනාන්දු. කුමාර කරුණාතිලක. සුරංග වික්‍රමසිංහ. වැනි අය මතක් කරන්න පුලුවන්.

ශ්‍රීනාත්
ඔබේ මේ ගමනට උදව් කළ අය කවිද?
රොෂාන් - හුඟ දෙනෙක් ඉන්නවා. ඒ අය අතරින් විජිත අමරසේකර. සුනිල් වීරසූරිය. මතක් කළ යුතුයි. ඊට අමතරව මගේ පියා ඩග්ලස් ප්‍රනාන්දු අක්කා ශිරෝමා ප්‍රනාන්දු මගේ බිරිඳ සුරංගි ඇතුළු මෙල්බන් වෙසෙන ශ්‍රී ලාංකිකයන් සියලුම දෙනා අපේ ගමනට උදව් කළා. මේ අයගේ නම් මම මතක් කළාට තව හුඟක් නම් තියෙනවා. ඒ සියලුම දෙනා අපි සැමවිට ආදරයෙන් සිහිපත් කරනවා.

"බී ෂාප්" දසවස් සැමරුම් ප්‍රසංගය ඔක්තෝබර් 4 වන දා රෝවිල් සෙකන්ඩරි කොලේජ් හිදී සවස 7 ට

රොෂාන් ලින්තොටගේ ආපසු හැරී බලයි

ශ්‍රීනාත්
ඔබේ කණ්ඩායමට අවුරුදු දහයක් සම්පූර්ණ වීම පිළිබඳව ඔබ විශේෂ යමක් කරන්න සැළසුම් කර තිබෙනවා ද?
රොෂාන් - ඔක්තෝබර් 4 වන දා රෝවිල් සෙකන්ඩරි කොලේජ් හි සවස 7 ට අපි සන්දර්ශනයක් පවත්වනවා. එයට සහභාගි වන ලෙස අපි සැම දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

ශ්‍රීනාත්
මේ ප්‍රසංගයට මහභාගිවන ඔබේ කණ්ඩායම?
රොෂාන් - දැන් අපේ සංගීත කණ්ඩායමේ ශිල්පීන් ලෙස මේ අය සහභාගි වෙනවා.
ලීඩ් ගිටාරයෙන් නීල් ගමගේ
කී බෝඩ් - චම්මි හේරත්
චමින්ද සහබන්දු - කී බෝඩ්
රවි ප්‍රනාන්දු - බේස්
මුදිත ඩිමෙල් - රිදම්
මංජු ජයකොඩි - ඩ්‍රම්ස්

ඊට අමතරව ප්‍රසංගයේදී නිමේෂා ගමගේ සහ මගේ බිරිඳ සුරංගි ප්‍රනාන්දු සහභාගි වෙනවා.

ශ්‍රීනාත්
අපි බී ෂාප් කණ්ඩායම හැම විටම දකින්නෙ වෙනත් ගායක ගායිකාවන් වෙනුවෙන් පසුබිම් සංගීතය සපයන අවස්ථා වලදියි. මේ ප්‍රසංගයේදී අපට ඔවුන්ගේම හැකියාවන් දැක බලා ගන්නට අවස්තාව උදා වෙනවා. මෙල්බන් වාසී සියලුම ශ්‍රී ලාංකිකයන් මේ ප්‍රසංගය නැරඹීමට එක්වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.



ශ්‍රී ලංකාව හා ජපානය අතර වාර්ෂිකව ඔරු පැදීමේ තරඟයක් පැවැත් වීමට දෙරටේ නිළධාරිහු තීරණය කළහ. මේ අනුව තරඟයට අදාළ නීති රීතීන්ද හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව එක් කණ්ඩායමක් සඳහා ක්‍රීඩකයින් පස් දෙනෙකු බැගින් යොදවා කිලෝ මීටර් 18 ක දුර ප්‍රමාණයක් ඔරු පැද යාමේ එකඟතාවයකට දෙරටේම නිලධාරිහු පැමිණියහ.

මෙම තරඟය සඳහා දෙරටේම ක්‍රීඩකයෝ මහත් උනන්දුවකින් පුහුණු වීමේ කටයුතු වල නිරත වූහ. අවසානයේ සැම දෙනාම පුළ පුළා බලා සිටි තරඟය පැවැත් වෙන දිනයද එළඹිණ. දෙපිලේම ඔරු පදින ක්‍රීඩකයෝ ජය ගැනීමේ එකම අභිලාෂයෙන් තරඟයට බට අතර ආරම්භයේදී කරට කර සිටියද ජපන් පිළ ශ්‍රී ලංකා පිළ කිලෝ මීටර් හයකින් අභිබවා අවසානයේදී ජයග්‍රහණය ලැබීය.

බලාපොරොත්තු සුනු කරගෙන යළිත් මව් රටට ශ්‍රී ලාංකික ක්‍රීඩකයෝ පැමිණි පසු ශ්‍රී ලංකා කණ්ඩායම පරාජය වූයේ ඇයිදැයි සොයා බැලීමට ඉහළ පෙළේ කමිටුවක් (කොමිසමක්) පත් කරන්නට යෙදුණි. දීර්ඝ කාලයක් කරුණු සළකා බැලීමෙන් පසුව කොමිසමේ වාර්ථාව එළි දැක්වීණ.

එම වාර්තාවට අනුව ශ්‍රී ලංකා පිළ පරාජයට පත් වීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා පිළ නියෝජනය කළ අයගෙන් ඔරුව පැද ඇත්තේ එක් ක්‍රීඩකයකු පමණක් වීමය. ඉතිරි හතර දෙනා කර ඇත්තේ ඔරුව පැදි ක්‍රීඩකයාට උපදෙස් දීමය. අනෙක් අතට ජපන් කණ්ඩායම ජයග්‍රහණය කළ ආකාරයද කොමිසම විසින් අධ්‍යයනය කර තිබිණි. ජපන් කණ්ඩායමට ජයගැනීමට හැකි වී ඇත්තේ ජපන් කණ්ඩායමේ ක්‍රීඩකයන් හතර දෙනෙකු ඔරුව පැදි අතර උපදෙස් දීම සිදු වී ඇත්තේ එක් ක්‍රීඩකයෙකු අතින් පමණක් වීමය.

මේ වාර්තාවේ සඳහන් කරුණු සළකා බැලූ නිලධාරිහු විසින් ඉතා වැදගත් තීරණ දෙකක් ගනු ලැබීය. ඒ අනුව ශ්‍රී ලංකා කණ්ඩායමේ සිටි උපදේශකයින් සිව් දෙනා හට වැඩිදුර පුහුණුව සඳහා විදේශ ශිෂ්‍යත්ත්ව ලබා දුන් අතර තවත් විශේෂ වරප්‍රසාද සහ බෝනස්ද ඔවුනට ලබා දීමට කටයුතු කළහ. දෙවෙනි වැදගත් තීරණය වශයෙන් උපදේශකයින් සිව් දෙනාට අවනත වෙමින් ඔරුව පැදි ක්‍රීඩකයාව වහාම ක්‍රියාත්මක වන පරිදි කණ්ඩායමෙන් ඉවත් කෙරිණි. කොමිසමේ තීරණය වූයේ එම උපදේශ දුන් ක්‍රීඩකයන්ගේ උපදෙස් වලට අනුව අනෙක් ක්‍රීඩකයා කටයුතු කළේ නම් තරඟය ජය ගත හැකිව තබූ බවය. එම ක්‍රීඩකයා වෙනුවට නිළධාරීන් හොඳින් දන්නා හඳුනන වෙනත් ක්‍රීඩකයෙකුව ආදේශ කරන ලදි.

ඊළඟ වසරේද තරඟය පැවැත්විණ. ඒ වතාවේදී ශ්‍රී ලංකා පිළ කිලෝ මීටර දොළහකින් අභිබවා ජය ගැනීමට ජපන් කණ්ඩායමට හැකි විය.

මේ කථාව මීට මදක් වෙනස් ස්වරූපයකින් එක්තරා දේශනයකදී මට අසන්නට ලැබුණේ මීට වසර ගණනාවකට පෙරය. එහෙත් මෙම කතාවෙන් කියවෙන පණිවිඩය අදටත්, සමහර විට හෙටටත් අපේ ශ්‍රී ලංකික දේශපාලනය, රාජ්‍යය ආයතන, පෞද්ගලික ආයතන, සහ නොයේකුත් සමිති සමාගම් වලද ස්වභාවය මොනවට නිරූපනය නොකරන්නේද? අපට ඕනෑවටත් වඩා කටින් වැඩ කරන පක්ෂ, විපක්ෂ මෙන්ම ප්‍රගතිශීලී නායකයෝත්, උපදේශකයෝත් සිටින අතර නැත්තේ වැඩකාරයෝය. වැඩ කරන එක් නායකයෙකු සිටීම වැඩකරන අයට නම් ප්‍රමාණවත්ය.

සාමන්ත තැන්නගේ